# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 393 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 07/03/2024<br>පැය 0820 |

## මාධ්‍ය නිවේදනය

**නදුන් චින්තක නොහොත් හරක් කටා යන සංවිධානාත්මක අපරාධකරු අපරාධ පරීක්ෂණ දෙපාර්මේන්තුවෙන් පැන යාමට තැත් කිරීමේ සිද්ධියට ආධාර අනුබල දුන් පොලිස් සැරයන්වරයෙකු අත්අඩංගුවට ගැනීම - ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවේ සිටින අපරාධ කල්ලි නායකයෙකු වන නදුන් චින්තක වික්‍රමරත්න නොහොත් හරක් කටා යන සැකකරු විසින් සැලසුම් සහගත ලෙස පොලිස් නිලධාරියෙකුගේ සහාය ඇතිව අත්අඩංගුවෙන් මිදි පලායාමට උත්සාහ කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් පොලිස්පතිතුමාගේ නියෝග හා උපදෙස් මත ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය මඟින් මේ වන විට විමර්ශන සිදුකරමින් පවතී.

ඒ අනුව දුරකතන දත්ත ඔස්සේ සිදුකරන ලද විමර්ශනයේදී ඉහත සංවිධානාත්මක අපරාධකරුට පලායාමට භාවිතා කිරීමේ අරමුණින් රැගෙන එන ලද යතුරුපැදියක් හා ආරක්ෂක හිස් වැසුමක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ තිබී අත්අඩංගුවට ගෙන තිබුණි. එම ආරක්ෂක හිස්වැසුම රැගෙන ඒම සඳහා සුද්දා නැමති පුද්ගලයෙකු සම්බන්ධ වී තිබූ අතර එම සැකකරු සම්බන්ධයෙන් සොයා බැලීමේදී ඔහු පදිංචි ස්ථානයන් මගහැර ගොස් ඇති බවට අනාවරණය වී ඇත.

එම සුද්දා නැමති සැකකරු පිලිබඳව තවදුරටත් දුරකතන විශ්ලේෂණයන් සිදු කරමින් කරන ලද විමර්ශනයේදී සුද්දා යන අය මාතර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයට අනුයුක්ත පොලිස් සැරයන්වරයෙකු සමඟ සම්බන්ධ වී ඇති බවට අනාවරණය වී ඇත. ඊට අමතරව මෙම සැරයන්වරයා නදුන් චින්තක වික්‍රමරත්න නොහොත් හරක් කටා යන සැකකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පැනයාමේ සිද්ධිය, විදේශ ගතව සිට මෙහෙයවනු ලැබූ ජයසේකර විතානගේ රුවන් චාමර නොහොත් මිදිගම රුවන් නැමැත්තා සමග ද වට්ස්ඇප් මාර්ගයෙන් සම්බන්ධ වෙමින් කටයුතු කර ඇති බවට අනාවරණය වී ඇත.

ඒ අනුව නදුන් චින්තක නොහොත් හරක් කටා යන සැකකරුට අත්අඩංගුවෙන් මිදී පලායාමේ සිද්ධියට ආධාර අනුබල දීම සහ තොරතුරු වසන් කිරීමේ චෝදනාව සම්බන්ධයෙන් 2024.03.06 වන දින දහවල් කාලයේදී සැකකාර පොලිස් සැරයන්වරයා මිදිගම පොලිස් වසමේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාර පොලිස් සැරයන්වරයා වයස අවුරුදු 36 ක්වූ දික්කුඹුර, අහංගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ප්‍රකාරව ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය මගින් විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**